**මහියංගණ ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
-----------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 25 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 10 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට මහියංගණ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ මහියංගණ ප්‍රාදේශීය සභාවට ලබාදෙන ලද එකක් රු.26,500 ක් වූ ජංගම කුටි 10 ක වටිනාකම රු.265,000 ක් ගිණුම්ගත නොකිරීම නිසා 2014 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම්වල වටිනාකම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය රු.265,000 බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන යටතේ මහජන උපයෝගීතාවයන් සඳහා සභාව වෙත ලබාදෙන ලද ගැල්වනයිස් කොඩි කණු 277 ක වටිනාකම වූ රු.273,820 ක් ප්‍රාග්ධනිත නොකිරීම නිසා 2014 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම්වල වටිනාකම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය රු.273,820 බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) අංක 53-5069 දරන කැබ්රථය විකිණීමට අදාලව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඌව පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.712,000 ක මුදල කලින් ලද ආදායමක් ලෙස සලකා ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.712,000 ක් අඩුවෙන්ද, කලින් ලද ආදායම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) දේශීය ණය හා සංවර්ධන අරමුදලෙන් වැසිජල අපවහන ව්‍යාපෘතිය සඳහා ලබාගන්නා ලද ණය මුදලේ 2014 දෙසැම්බර් 31 දිනට ණය ශේෂය වන රු.2,756,855 ක් ගිණුම්ගත නොකිරීම නිසා 2014 දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වගකීම්වල වටිනාකම රු.2,756,855 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.3.2 **නොසැසඳූ පාලන ගිණුම්**

-------------------------

ගිණුම් විෂයයකට අදාලව උපයෝගී ලේඛන අනුව ශේෂය රු.4,918,362 ක් වූ අතර, පාලන ගිණුම් අනුව ශේෂය රු.2,300,784 ක් විය. ඒ අනුව රු.2,617,578 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

----------------------------------

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 20,002,146 ක් වූ අතර, එදිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.11,519,096 ක් විය.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

----------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.6,592,973 ක් වූ ගණුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

----------------------------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය | පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව පුද්ගලයන්ට, ප්‍රජා පාදක සංවිධානවලට හා ආගමික සිද්ධස්ථානවලට ද්‍රව්‍යාධාර ලබාදීම සඳහා අවස්ථා 21 කදී රු.547,264 ක මුදලක් වැයකර තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි | |
| | මු.රෙ. 571 | තැන්පත් කර වසර 02 ක් තුල හිමිකම් නොපෑ රු.64,570 ක් වටිනා තැන්පතු 10 ක් නියාදනය කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 1:6 හා 4 වගන්ති | සභාවේ සේවය කර සේවය හැර ගිය, ස්ථාන මාරුවී ගිය නිලධාරීන්/සේවකයින් 16 දෙනෙකුගෙන් අයවිය යුතු රු.33,711 ක සේවක ණය අයකරගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,411,275 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.288,212 ක් විය. ඒ අනුව රු.5,699,487 ක වාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

### 2.2 ආදායම් පරිපාලනය

---------------------

#### 2.2.1 වරිපනම් බදු

---------------

වර්ෂ පහකට වරක් වරිපනම් බදු සංශෝධනයක් සිදුකර ඒ අනුව බදු අයකළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා ද 2001 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන වරිපනම් බදු අයකර තිබුණි.

2.2.2 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු ආදායම් පහත පරිදි වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 1,345,752 |
| මුද්දර ගාස්තු | 2,686,823 |
| | 4,032,575 |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

අංක 53 – 5069 දරන කැබ් රථය විකිණීමට අදාල රු.712,000 ක මුදල ඌව පළාත් පාලන අමාත්‍යාංශය මඟින් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

3.2 **නිෂ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්**

(අ) 12.5 KVA ධාරිතාවයකින් යුත් Mack Power විදුලි ජනක යන්ත්‍රය අක්‍රියවීම නිසා අලුත්වැඩියා කර ප්‍රයෝජනයට නොගෙන ගබඩා අංගනයේ තිබුණි.

(ආ) අංක 37-7490 දරන ට්‍රැක්ටර් රථය ප්‍රයෝජනයට නොගෙන සහා අංගනයේ ගාල්කර තිබුණි.

3.3 **හඳුනාගත් අලාභ**

වටිනාකම රු.20,758 ක් වන ගැල්වනයිස් කොඩි කණු 21 ක ප්‍රමාණයක් අස්ථානගත වී තිබුණි.

4. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ගබඩා පාලනය